රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 05/96

මගේ අංකය :- I/543ඊ/17ඩී/94/02
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි
කර්මාන්ත හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.
1996.02.15

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානින් වෙත.

## වසා දමන ලද දෙපාර්තමේන්තුවල සේවකයන්ට වන්දි ගෙවීම

රජයේ දෙපාර්තමේන්තු වසා දැමීම හේතුකොට ගෙන වසර 10 ක සේවා කාලයක් සම්පූර්ණ නොකිරීම නිසා වෘද්ධෝපගත ප්‍රතිලාභ රහිතව සේවය අවසන් කරන ලද නිලධාරීන්ට සහන සලසමින් නිකුත් කරන ලද 1992 ඔක්තෝම්බර් 30 දිනැති අංක : 31/92 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට ඔබගේ අවධානය යොමු කරවමි.

02. මෙම චක්‍රලේඛය යටතේ ප්‍රතිලාභ ලද නිලධාරීන්ට , ඉදිරියට සේවය කිරීමට ඇති කාල පරිච්ඡේදයේ සේවය කිරීමට තිබුණු අවස්ථාව අහිමිවීම සැලකිල්ලට ගෙන වන්දි මුදලක් ගෙවීමට රජය තීරණය කර ඇත. ගෙවිය යුතු මුදල පහත දැක්වෙන පරිදි ගණන් බලා තීරණය කල යුතුය.

$$\text{(ගෙවිය යුතු මුදල)} = \frac{\text{අවසන් වරට ලද මාසික වැටුප x මාස 60 x 75 x විශ්‍රාම ලද වයස (අවුරුදු වලින්) x අහිමි සේවා කාලය (මාස වලින්)}}{\text{100 x අවුරුදු 55 x මාස 360}}$$

(විශ්‍රාම ලද දින සිට 55 වැනි ජන්ම දිනය තෙක් සේවා කාලය)

මේ යෝජනා ක්‍රමය යටතේ ගෙවිය හැකි උපරිම වන්දි මුදල රු. 100,000/- කට නොවිය යුතුය. දැනටමත් යම් වන්දියක් මේ වෙනුවෙන් ගෙවා ඇත්නම්, එම වන්දි මුදල මේ ක්‍රමය යටතේ ගෙවන වන්දියෙන් අඩු කර ගත යුතුය.

මෙම වන්දි මුදල් ලබා ගත් විශ්‍රාමිකයෙකු රජයේ දෙපාර්තමේන්තුවක හෝ නියෝජිතායතනයක විකල්ප රැකියාවක් ලදොත් ඔහු / ඇය ලබා ගත් වන්දි මුදල ආපසු ගෙවිය යුතු වන අතර, නැවත සේවයේ යෙදුනු දින සිට 55 වැනි ජන්ම දිනය එළඹෙන තෙක් ඔහු / ඇයගේ විශ්‍රාම වැටුප් අවුරා තැබිය යුතුය.

04. 1992.01.01 දින හෝ ඉන් පසුව වසා දමන ලද දෙපාර්තමේන්තුවල සේවක කොටස් පමණක් මේ යටතේ වන්දි ලැබීමට හිමිකම් ලබති.

05. මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ මහා භාණ්ඩාගාරයේ එකගත්වය ඇතිවය.

අ.කලෝ/(ආර්.එස්.ජයරත්න)
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි කර්මාන්ත හා
පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය